**ශීර්ෂය 419 - කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**
**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 මතය**
**------**

කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අප්‍රේල් 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචනය කර සැකසූ ඇගයීම් වාර්තාවේ පිටපතක් ඔබ වෙත අවශ්‍ය පරිදි ලබාදීමට සටහන් කර ගතිමි. | විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 565(5) | එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් විගණකාධිපති වෙත යැවීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද එසේ කටයුතු නොකිරීම හේතුවෙන් පුනරාවර්ථන වැය විෂයයන් 24 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 50 ක සිට සියයට 100 ක් අතර පරාසයකින් මුලු වටිනාකම රු.58,882,817 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. | රට තුළ පැවති කොරෝනා වසංගතය හේතු කොට ගෙන බලාපොරොත්තු වූ පරිදි කාර්යාල කටයුතු සිදු නොවූ බැවින්ද, රාජ්‍ය අමාත්‍යාංශය විදේශ අමාත්‍යාංශයේ ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති බැවින්ද, රාජ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දෙන බැවින්ද, පුනරාවර්තන වියදම් සඳහා වූ වියදම් ඉතිරි විය. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කළ යුතු වීම. |

## 2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැරකම්වල වටිනාකම රු. 160,849 ක් ලෙස දක්වා තිබුණු අතර SA – 92 බැරකම් වාර්තාවේ බැරකම්වල වටිනාකම රු.304,219 ක් විය. ඒ අනුව රු.143,370 ක වෙනසක් නිරීක්ෂණය විය. | SA 92 වාර්තාවේ BOC Travels හි රු.178,370 ක් ලෙස පෙන්වන බැරකම එම වාර්තාවේ දෝෂයකි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුවට 2022 පෙබරවාරි 02 දින විද්‍යුත් ලිපියක් මඟින්ද දැනුම් දෙන ලදී.<br>රු.35,000ක් වටිනා වවුචර්පත සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් වුයේ බැරකම් Web interface වෙත Upload කිරීමෙන් පසුව වීම නිසා SA 92 වාර්තාවට ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. | අදාල වාර්තා එකම අයුරින් පවත්වා ගත යුතු වීම. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ වටිනාකම රු. 262,003 ක් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) පරිදි කටයුතු කර නොතිබුණි. | අදාළ ආදායකයන්ට දැනුම් දී ඉල්ලීම් ඉදිරිපත් නොවන චෙක්පත් රජයේ ආදායමට බැර කිරීමට සටහන් කර ගතිමි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ආ) 2021 ඔක්තෝබර් මස බැංකුව විසින් හර කරන ලද රු. 48,258 ක ශේෂය තැන්පත් කරන ලද්දේ කවුරුන්ද යන්න හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | බැංකුවෙන් වෙනත් ආයතනයක ගිණුමකට සිදු කල යුතු සටහනකි. මෙය නිවැරදි කිරීමට බැංකුවට කිහිපවරක්ම වාචිකව දැනුම් දුන්නද නිවැරදි කර නොතිබුණි. | ශේෂ හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා පදනම මත පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan) පිළියෙල කර නොතිබුණි. එම හේතුවෙන් අමාත්‍යාංශය විසින් වෙළඳ ප්‍රවර්ධනය, ඍජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම, සංචාරක ප්‍රවර්ධනය, විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම සහ කලාපීය සහයෝගිතා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධීකරණය කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම යනාදිය සඳහා සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු. 75,810,700 ක් වැය කර තිබුණද, අත්කර ගනු ලැබූ ප්‍රගතිය ඇගයීමට නොහැකි වී ඇත. | ඉදිරි වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා පදනම මත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 4. යහපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා 40 (2)(1) වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිළධාරියා විසින් එම රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත් කරනු ලැබිය යුතු වුවද එසේ කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක ඇතුළු කාර්යය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර මේ වන තෙක් පිළිතුරක් ලබා දී නොමැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 23 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 16 ක් වීම නිසා පුරප්පාඩු සංඛ්‍යාව 07 ක් විය. | විධායක මට්ටමේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට මේ වනවිට කටයුතු සිදුවෙමින් පවතින බවද, ද්විතියික මට්ටමේ සංවර්ධන නිලධාරී පුරප්පාඩු ද මේ වනවිට සම්පූර්ණ වී පවතින බව කාරුණිකව දන්වමි. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |